**දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - 2014**

**----------------------------------------------**

දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අපනයන ආනයන සඳහා වන චීන බැංකුව අතර 2011 පෙබරවාරි 17 දිනැති එළඹි පැකේජ 1 සඳහා අංක බීඑල්ජ් 201011 හා පැකේජ 2 සඳහා අංක බීඑල්ජ් 201012 දරන ණය ගිවිසුම් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**--------------------------------------------------------------------------------**

දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ ණය ගිවිසුම් වලට අනුව, එවකට මහා මාර්ග හා වරාය අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ ප්‍රථම අධිවේගී පිවිසුම් පාලනයන් සහිත පිවිසුම් මාර්ග වලට සම්බන්ධ වෙමින් කර්මාන්ත, සංචාරක, ධීවර හා කෘෂිකර්මාන්තය වර්ධනය දිරිගැන්වීම මඟින් දකුණු පලාතේ ආර්ථික සංවර්ධනයට සහය වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම් වලට අනුව, කොට්ටාව සිට ගොඩගම දක්වා කිලෝමීටර 126 ක ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 661.14 ක් වන අතර එයින් පින්නදූව සිට ගොඩගම දක්වා අධිවේගී මාර්ග කිලෝමීටර 30.25 ක් ඉදිකිරීමට එ.ජ.ඩො. මිලියන 138.21 ක් හෝ සියයට 20.9 ක් අපනයන ආනයන සඳහා වන චීන බැංකුව විසින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. දක්ෂිණ අධිවේගය ඉදිකිරීම සඳහා සමස්ථ අරමුදල් ප්‍රභවයන් වල විස්තර පහත දැක්වේ.

| <u>ණය සපයනු ලබන නියෝජිතායතන</u> | <u>එකඟ වූ වටිනාකම</u><br><u>එ.ජ.ඩො. මිලියන</u> | <u>ප්‍රතිශතය</u><br><u>%</u> |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව | 186.00 | 28.13 |
| ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වන ජපාන බැංකුව | 103.00 | 15.58 |
| නෝඩික් සංවර්ධන අරමුදල | 5.40 | 0.82 |
| ස්විඩන් ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතාවය | 0.80 | 0.12 |
| චීනයේ එක්සිම් බැංකුව | 138.21 | 20.90 |
| ශ්‍රීලංර | <u>227.73</u> | <u>34.45</u> |
| එකතුව | **<u>661.14</u>** | **<u>100.00</u>** |

කොට්ටාව සිට පින්නදූව දක්වා අධිවේගී මාර්ග කොටසේ දිග කිලෝමීටර 95.05 ක් හා ගාලු වරාය පිවිසුම් මාර්ග කිලෝමීටර 5 ක් සම්පූර්ණ කර 2011 නොවැම්බර් 27 දින රථ වාහන සඳහා විවෘත කර තිබුණි. අධිවේගී මාර්ගයේ පින්නදූව සිට මාතර ගොඩගම දක්වා ඉතිරි කොටස 2014 මාර්තු 16 දින රථ වාහන සඳහා විවෘත කෙරිණි. අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් සම්පූර්ණ කිරීමෙන් පසුව, අධිවේගී මාර්ගයේ ඇස්තමේන්තු පිරිවැයෙන් රු. මිලියන 4,842 ක් වටිනා ඉතිරිය, දක්ෂිණ අධිවේගයට සෘජු හා වක්‍ර සම්බන්ධතාවයක් ඇති අනෙකුත් ප්‍රාදේශීය මාර්ග 06 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා

උපයෝජනය කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය තීරණය කර තිබුණි. පින්නදූව සිට ගොඩගම දක්වා අධිවේගී මාර්ග කොටස ඉදිකිරීම හා අනෙකුත් මාර්ග 06 ක ප්‍රතිසංස්කරණ වැඩ වෙනුවෙන් සිදු කළ ක්‍රියාකාරකම් මත අදහස් දැක්වීම් මෙම වාර්තාවේ ඇතුළත්ය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි.ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරික්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයන්ගෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.2.1 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

අධිවේගී මාර්ගය අවසානයේ 'නිල්වලා පිවිසුම' සිහිවටන ඵලකයේ විස්තර පුවරුවේ මිල කැඳවීම සඳහා දේශීය සැපයුම්කරුවන් 02 දෙනෙකුගෙන් ව්‍යාපෘතිය සීමිත මිල කැඳවීම් සිදු කර තිබුණු අතර රු.4,510,000 ක පිරිවැයකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කෙසේ වෙතත් මූලික කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 64 ක් නියෝජනය කළ පිරිවැය රු. 2,891,337 ක අමතර වැඩ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.13.4 වගන්තිය ප්‍රකාරව අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

## 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, පින්නදූව සිට ගොඩගම දක්වා අධිවේගී මාර්ග කොටස හා අනෙකුත් මාර්ග 06 වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් වල මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | 2014 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | 2014 දෙසැම්බර් 31 දින දක්වා |
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| චීන එක්සිම් බැංකුව | 138.21 | 15,895.00 | 3,100.00 | 1,994.00 | 10,617.00 |
| *ශ්‍රී.ලං.ර | - | 2,805.00 | 200.30 | 200.30 | 3,241.00 |
| එකතුව | 138.21 | 18,700.00 | 3,300.30 | 2,194.30 | 13,858.00 |

* දේශීය බැංකුවකින් ලබා ගත් ණය මුදලින් ව්‍යාපෘති වියදම සිදු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වැය කළ රු. මිලියන 87.65 ක් ශ්‍රී ලංකා රජයේ දායකත්වය තුළ ඇතුළත්ය.

## 3.2 භෞතික කාර්යසාධනය

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දකුණු පළාතේ ඉහත සඳහන් කළ මාර්ග 06 හි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා කොන්ත්‍රාත්, එකම කොන්ත්‍රාත්කරු වෙත පිරිනමා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට නිම කිරීමට අපේක්ෂිත විය. 2014 දෙසැම්බර් 31 දිනට එම මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| මාර්ගයන් | දිග කිලෝමීටර | 2014 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය % |
|---|---|---|
| යක්කලමුල්ල - ඉමදූව මාර්ගය | 6.2 | 99 |
| දොරපේ - හියාරේ මාර්ගය | 8.7 | 87 |
| ගොඩගම - තෙලිජ්ජවිල මාර්ගය | 4.5 | 68 |
| වැලිගම - කනන්කේ මාර්ගය | 9.6 | 66 |
| අහංගම - ඉමදූව මාර්ගය | 10.0 | 65 |
| වැලිගම - තෙලිජ්ජවිල මාර්ගය | 7.7 | 31 |

(ආ) කාර්ය මණ්ඩලයේ වගකීම් පැහැදිලිව හඳුනාගත හැකි වන භෞතික හා මූල්‍ය ඉලක්ක ළඟා කර ගැනීමට හැකි විස්තරාත්මක සමස්ථ සැලසුම පදනම් කර ගනිමින් ව්‍යාපෘතිය විසින් සකස් කළ යුතු ක්‍රියාකාරි සැලස්මක් මාර්ග 06 හි ප්‍රතිසංස්කරණය සඳහා සකස් කර නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලික ප්‍රමාණ පත්‍රයේ සිදුකර ඇති ඇස්තමේන්තු වැරදි හේතුවෙන්, පින්නදූව සිට ගොඩගම දක්වා අධිවේගී මාර්ග කොටස ඉදිකිරීමේ ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 18,700 සිට රු.මිලියන 15,470 ක් දක්වා අඩුකර තිබුණි. කෙසේ වෙතත් ඒ සඳහා දරන ලද තත්‍ය වියදම රු. මිලියන 13,858 ක් විය. එමනිසා රු. මිලියන 4,842 ක මුළු ඉතිරිය ඉහත සඳහන් මාර්ග 06 ප්‍රතිසංස්කරණයට උපයෝජනය කර තිබුණි.

(ආ) පරීක්ෂණ වාර්තා අනුව, දොරපේ- හියාරේ මාර්ගයේ අවස්ථා 49 ක් හා වැලිගම-කනන්කේ මාර්ගයේ අවස්ථා 45 ක සැලකිය යුතු දුර්වලතා ඇතුළුව ව්‍යාපෘතිය විසින් ප්‍රතිසංස්කරණය කළ මාර්ගවල පස් තැලීමේ දුර්වල අවස්ථා 169 ක් වාර්තා වී තිබුණි.

(ඇ) ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග වල හැරුම් සාම්පල සනකම් පරීක්ෂාවන් සියයට 98 ක් වන අපේක්ෂිත තැලුම් ප්‍රතිශතයට වඩා සෑම අවස්ථාවකදීම අඩු ප්‍රතිඵලයක් ලබා දී තිබුණද එවැනි දුර්වලතාවයන් පිළිසකර කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 අනාර්ථික ගණුදෙනු

----------------------

අධිවේගය අවසානයේ 'නිල්වලා පිවිසුම' සිහිවටන ඵලකය ඉදිකිරීම හා සවිකිරීම සඳහා රු.මිලියන 4.5 කට පිරිනමන ලද කොන්ත්‍රාත්තුව සති 03 කින් සම්පූර්ණ කිරීමට අපේක්ෂිත විය. කෙසේ වෙතත් සති 08 කින් පසුව සවිකිරීමේ වැඩ අවසන් කර තිබුණු අතර කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු. 825,000 ක් අයකරගෙන තිබුණි. පසුව සිහිවටන ඵලකයේ නිර්මාණකරුගේ උපදෙස් මත මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති ප්‍රමාද ගාස්තුව කපා හැර තිබුණි.

## 3.5 මතභේදයට තුඩු දෙන කරුණු

------------------------------

පින්නදූව සිට ගොඩගම මාර්ග කොටසෙහි ආරම්භ කිරීමේ උත්සවය සඳහා ව්‍යාපෘතිය විසින් රු. මිලියන 84.74 ක් වියදම් කර තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.6 නිෂ්කාර්ය/ ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

මාතර 'නිල්වලා පිවිසුම' හි සවිකිරීමට අපේක්ෂිත රු. මිලියන 4.19 ක පිරිවැයකට මිලදී ගත් කිඹුලා ආකෘති 02 ක් උඩුකාව ව්‍යාපෘති කාර්යාලයේ නිෂ්කාරව තිබුණු බව ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී අනාවරණය විය.